මිල රු. 50.00

Designed & Printed by **AGRICULTURE PUBLICATION UNIT**, Department of Agriculture
2017 J-7/126/B C-3000(S)

ගොවිතැනට මුල්තැන

# ගොවිබිමට සරිලන යන්ත්‍රෝපකරණ



කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කෘෂිකර්ම අමාත්‍යාංශය

# ගොවිබිමට සරිලන යන්ත්‍රෝපකරණ

කෘෂිකර්ම අමාත්‍යාංශයේ
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
2017

# ගොවිබිමට සරිලන යන්ත්‍රෝපකරණ

**උපදෙස් හා තාක්ෂණික දායකත්වය**

බී. එම්. සී. පී. බාලසූරිය

ජී. ඒ. එම්. ඒ. විජේතුංග

එම්. එච්. ජේ. ජේ. හේමචන්ද්‍ර

එච්. එම්. ඒ. පී. හේරත්

එස්. එම්. ආර්. අභයලාල්

ඊ. ඩබ්. පී. සී. කරුණාරත්න

**මෙහෙයවීම**

එස්. පෙරියසාමි

ජේ. කේ. ඒ. හෙට්ටිආරච්චි

**සංස්කරණය හා සම්බන්ධීකරණය**

මිලින්ද සමරකෝන්

ජේ. ආර්. බී. හේරත්

**පරිගණක පිටු සැකසීම හා නිර්මාණය**

අසිත බස්නායක

තිළිණි මධුෂිකා

**මුද්‍රණය**

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකයේ මුද්‍රණාලය

**ප්‍රකාශක**

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය,

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| වී වගාවේ යාන්ත්‍රීකරණ කට්ටලය | 01 |
| අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල යාන්ත්‍රීකරණය | 08 |
| අනෙකුත් වගාවන් සඳහා භාවිතා වන යන්ත්‍ර | 15 |
| ජල සම්පාදනය | 20 |

## හැඳින්වීම

අතීතයේ දී මිනිසා විසින් බිම් සැකසීම සඳහා දැවයෙන් සකස් කර ගත්, තියුණු තලයන් සහිත උපකරණ භාවිතය ආරම්භ කළ දින සිට යාන්ත්‍රීකරණය ගොවිතැනට ආදේශ විය. ඉන්පසු ක්‍රම ක්‍රමයෙන් එය සංවර්ධනය වූ අතර, උදළු සහ සතුන්ගෙන් සී සෑම සඳහා භාවිතා කරන උපකරණ නිර්මාණය හා වර්තමානයේ භාවිතා කරන සංකීර්ණ යන්ත්‍ර දක්වා එය පුළුල් විය. ඒ අනුව යාන්ත්‍රීකරණය විවිධ අවධීන් පසු කර වර්තමාන තත්ත්වය කරා ළඟා වූ ආකාරය දැකිය හැකිය.

ශ්‍රී ලාංකික ගොවි ජනතාව ද උක්ත අවධීන් පසු කරමින් සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍රය වැනි නවීන යන්ත්‍ර භාවිතය දක්වා තම විභවයන් පුළුල් කර තිබේ. අප රට තුළ දී ඒ සඳහා ප්‍රබලතම දායකත්වය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබාදුන් අතර ඒ සඳහා පිහිටුවා ඇති මහඉලුප්පල්ලම ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය ශ්‍රී ලාංකික ගොවි ජනතාවට යාන්ත්‍රීකරණය හඳුන්වා දීම සඳහා කටයුතු කරන ප්‍රධානතම හා එකම රාජ්‍ය ආයතනය වේ.

ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය යටතේ ඇති උප ආයතනයකි. මහඉලුප්පල්ලම කෘෂිකර්ම සංකීර්ණයේ පිහිටා ඇති මෙම ආයතනය අප රටට උචිත කෘෂි යන්ත්‍ර පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, වෙනත් රටවල නිර්මාණය කරන ලද කෘෂි යන්ත්‍ර අප රටට ගැළපෙන පරිද්දෙන් වැඩිදියුණු කිරීම, මෙම යන්ත්‍ර දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදකයන් පුහුණු කිරීම, කෘෂි යාන්ත්‍රකරණය පිළිබඳව නිලධාරින් හා ගොවි ජනතාව දැනුවත් කිරීම හා පුහුණු කිරීම සිදු කරනු ලබයි. මීට අමතරව ආනයනික හා දේශීයව නිෂ්පාදනය කරන කෘෂි යන්ත්‍ර පරීක්ෂාවට ලක් කර එහි යෝග්‍යත්වය සහ කාර්යක්ෂමතාවය පිළිබඳව පරීක්ෂණ වාර්තා නිකුත් කරනු ලබයි. මෙම ආයතනය විසින් වී වගාව, බඩඉරිඟු වගාව, වෙනත් ගොඩ බෝග වගාවන් හා ජල සම්පාදනය සඳහා යන්ත්‍රෝපකරණ කට්ටල නිපදවා ඇති අතර ඒ පිළිබඳ සංෂික්ප්ත විස්තර මෙහි පෙළ ගස්වා ඇත.

## වී වගාවේ යාන්ත්‍රිකරණ කට්ටලය

වී වගාවේදී ගොවීන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව ප්‍රමාණවත් ලාභයක් නොලැබීමයි. ශ්‍රමය සඳහා ගෙවීමට සිදුවන අධික වියදම එයට හේතුවී ඇත. මූලික බිම් සැකසීම, වල් මර්ධනය, අස්වනු නෙලීම, අස්වනු මැඩීම, අස්වනු සැකසීම සඳහා විශාල ශ්‍රමයක් යෙදවීමට සිදුවන බැවින්, ඒ සඳහා වැයවන වියදම අධික නිසාම වී වගාවේදී ගොවීන් දැඩි අසීරු තත්ත්වයකට පත් වී ඇත.

මේ සඳහා වන එකම විසඳුම යාන්ත්‍රිකරණය වන අතර වගාවේ එක් එක් අවධීන්වල ක්‍රියාකාරකම් සඳහා වෙන වෙනම යන්ත්‍ර භාවිතා කිරීම මෙන්ම යාන්ත්‍රිකරණ කට්ටලයක් ලෙස වගාවේ ප්‍රධාන අවධීන් ආවරණය වන ආකාරයට යන්ත්‍ර භාවිතය වියදම් අවම කරන අතර ගුණාත්මකභාවයෙන් ඉහළ වගාවක් ලබා ගැනීමටද උපකාරී වේ. ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය (FMRC) මඟින් වී වගාව සඳහා හඳුන්වා දී තිබෙන යාන්ත්‍රිකරණ කට්ටලය පහත පරිදි වේ.

## යාන්ත්‍රිකව බීජ වැපිරීම

### මඩ වී බීජ වප්කරය



මඩ වී බීජ වප්කරය

කුඹුරුවල පේළියට පැළ වී (කණු කැපුණු වී) දැමීම සඳහා සුදුසු යන්ත්‍රයකි. ඉතා හොඳ බිම් සැකසීමක් ඇති ක්ෂේත්‍රයේ වප්කරය ක්‍රියා කරවීම පහසු වේ. එමෙන්ම මෙම යන්ත්‍රයෙන් සිටවූ බීජ වල සාර්ථක පැළ වර්ධනයක් දක්නට ලැබේ. බීජ පේළියට වගා කිරීමෙන් වගාව ඉතා පහසුවෙන් නඩත්තු කිරීමේ හැකියාවක් ද පවතී.

පේළි අතර අඟල් 8 ක පරතරයකින් වරකට පේළි 4 ක් ක්ෂේත්‍රයේ බීජ වැපිරීම සිදු කරන අතර, අක්කරයක් සඳහා බීජ වී අවශ්‍යතාවය කිලෝ ග්‍රෑම් 30 ක් පමණ වේ. ක්‍රියාකරුවෙකුට දිනකට අක්කර 02 ක පමණ බීජ වැපිරීම සිදු කළ හැකි අතර, බීජ වැපිරීමට පෙර දින ක්ෂේත්‍රය සකස් කර හොඳින් මඩ තැන්පත් වූ පසු යන්ත්‍රය භාවිතා කර බීජ වැපිරීම සිදුකළ යුතුය. යාන්ත්‍රික වල් මර්ධන උපකරණ භාවිතය සඳහා අවශ්‍ය පසුබිම සකසා දීම විශේෂත්වයකි. මෙම යන්ත්‍රයේ වර්තමාන මිල රු. 18,000.00 ක් පමණ වේ.

### FMRC ඩ්‍රම් සීඩරය



FMRC ඩ්‍රම් සීඩරය

මඩ වී බීජ වප්කරය වැඩිදියුණු කිරීමෙන් නිර්මාණය කර තිබෙන අතර, ක්ෂේත්‍රයේ පේළි අතර අඟල් 8 ක හා පේළියක පැළ අතර අඟල් 3 - 4 ක පරතරයකින් බීජ වැපිරීම සඳහා භාවිතා කරනු ලබයි. අක්කරයක් සඳහා බීජ වී අවශ්‍යතාවය කිලෝ ග්‍රෑම් 12 ක් පමණ වන අතර සාමාන්‍ය වැපිරීමේ ක්‍රමවලට සාපේක්ෂව 75% ක පමණ බීජ වී ඉතිරි කරයි. මෙහි ක්ෂේත්‍ර ධාරිතාවය දිනකට අක්කර 02 ක් පමණ වන අතර, දියාරු ස්වභාවය අඩු, හොඳින් මඩ තැන්පත් වූ ක්ෂේත්‍රයකදී නිවැරදි ආකාරයට පේළි වශයෙන් බීජ වැපිරීම සිදු කළ හැක. මෙම යන්ත්‍රය ද වරකට පේළි 4 ක බීජ වැපිරීම සිදු කරන අතර, පේළි අතර ඒකාකාරී පරතරයක් තිබීම නිසා යාන්ත්‍රික වල් මර්ධනයට යෝග්‍ය වේ. මෙම යන්ත්‍රයේ වර්තමාන මිල රු. 21,000.00 ක් පමණ වේ.

### පැදගෙන යන ඩ්‍රම් සීඩරය



පැදගෙන යන ඩ්‍රම් සීඩරය

ප්‍රමාණයෙන් විශාල ක්ෂේත්‍රයන් සඳහා භාවිතා කිරීමට යෝග්‍ය අයුරින් අශ්ව බල 3.5 ක් පමණ වන එන්ජිමක ආධාරයෙන් නිර්මාණය කර තිබේ. එක් වරකට පේළි 10 ක පමණ බීජ වැපිරීම සිදු කළ හැකි අතර, බිත්තර වී අවශ්‍යතාවය අක්කරයකට කිලෝ ග්‍රෑම් 12 - 15 ක් පමණ වේ. දිනකට අක්කර 04 ක පමණ ප්‍රමාණයක් එක් අයෙකුට බීජ වැපිරීම සිදු කළ හැකි අතර, යාන්ත්‍රික වල් මර්ධන ක්‍රම මඟින් වල් මර්ධනය සිදු කළ හැක. ක්ෂේත්‍රයේ පහසුවෙන් හැසිරවිය හැකි පරිදි යන්ත්‍රය නිර්මාණය කර තිබේ. යන්ත්‍රය භාවිතා කරන දිනට පෙර දින ක්ෂේත්‍රය හොඳින් මට්ටම් කර සකස් කර ගත යුතුවේ.

## යාන්ත්‍රිකව ගොයම් පැළ සිටුවීම

### අතින් ක්‍රියා කරන ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය



අතින් ක්‍රියා කරන
ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය

මෙම යන්ත්‍රය සඳහා දින 14 - 21 ත් අතර වයස් ප්‍රමාණයේ වූ වැඩි දියුණු කළ ඩැපොග් ක්‍රමයට සැකසූ පැළ තවාන් භාවිතා කරනු ලැබේ. මෙම

ගොයම් පැළ සිටුවන යන්ත්‍රයෙන් දිනකට අක්කර 1/2 - 3/4 ක ගොයම් පැළ සිටුවීමට ශ්‍රමිකයින් දෙදෙනෙකු ප්‍රමාණවත් වේ. මෙම යන්ත්‍රය වරකට පේළි 4 ක් හා 6ක් සිටුවිය හැකි පරිදි ආකාර 02 කින් නිර්මාණය කර තිබෙන අතර, පේළි 02 ක් අතර අඟල් 8ක පරතරයක් පවත්වා ගත හැක. පේළියක පැළ අතර පරතරය ක්‍රියාකරුවා යන්ත්‍රය ඉදිරියට අදින ප්‍රමාණය අනුව වෙනස් වේ.

## ගොයම් පැළ පේළියට සිටුවීමෙන් ඇතිවන වාසි

- අවශ්‍ය වන බිත්තර වී ප්‍රමාණය අඩුවීම.
- වල් මර්ධනය සඳහා රසායනික ද්‍රව්‍ය වලට යන වියදමක් නොමැති වීම.
- පරිසර දූෂණය අවම වීම.
- වගාවේ පවතින වෙනත් ප්‍රභේද වල වී පැළ පහසුවෙන් හඳුනාගෙන ඉවත් කිරීමේ හැකියාව.
- අහිතකර කාළගුණ තත්ව (වර්ෂාව/ සුළඟ) යටතේ වගාව ඇද හැළීම පාලනය වීම.
- පේළි අතර පහසුවෙන් ගමන් කළ හැකි නිසා පොහොර හා කෘමිනාශක පහසුවෙන් යෙදීමේ හැකියාව.
- පේළි අතර හොඳින් හිරු එළිය සහ වාතාශ්‍රය ලැබීම නිසා ශාකය හොඳින් වර්ධනය වීම මෙන්ම කීඩෑ හානි සහ වෙනත් දිලීර රෝග අවම තත්ත්වයක පැවතීම.
- අවම ජල සම්පාදන තත්ත්වයක් යටතේ සාර්ථකව වී වගා කිරීමට හැකි වීම.
- ඉහළ අස්වැන්නක් ලැබීම. (වැපිරීමට සාපේක්ෂව 10% කට වඩා වැඩි අස්වැන්නක් ලබා ගත හැකිය)

වර්තමානයේ මෙම යන්ත්‍රයක මිල රු. 40,000/- පමණ වේ.

## බලවේග ගොයම් පැළ සිටුවන යන්ත්‍රය



බලවේග ගොයම් පැළ සිටුවන යන්ත්‍රය (පසුපසින් ඇවිදගෙන යන මාදිලිය)

මෙම යන්ත්‍රය සඳහා දින 14 - 21 අතර වයස් ප්‍රමාණයේ වැඩිදියුණු කළ ඩැපොග් ක්‍රමයට සැකසූ පැළ තවාන් භාවිතා කරනු ලැබේ. මෙමගින් දිනකට අක්කර $2\,{}^{1}/_{2}$ ක ගොයම් පැළ සිටුවීම සඳහා ශ්‍රමිකයන් දෙදෙනෙකු ප්‍රමාණවත්ය. මෙම යන්ත්‍රය මඟින් වරකට පේළි 4 ක් හෝ 6 ක් සිටුවිය හැකි පරිදි ආකාර දෙකකින් නිර්මාණය කර ඇත. පේළි 2 ක් අතර පරතරය අඟල් 12 ක් පමණ වේ. පේළියක පැළ අතර පරතරය සෙන්ටිමීටර් 12 සිට සෙන්ටිමීටර් 21 දක්වා වෙනස් කළ

හැකිය. තවද එක් ස්ථානයක සිටුවිය හැකි පැළ ප්‍රමාණය හා ගැඹුර වෙනස් කළ හැකිය.

මෙම යන්ත්‍රය භාවිතයෙන් මීට ඉහත දක්වා ඇති ගොයම් පැළ පේලියට සිටුවීම මඟින් ලබා ගත හැකි වාසි සියල්ලම ලබා ගත හැකිවන අතර, මෙම යන්ත්‍රයේ ධාරිතාවය අනුව මහා පරිමාණ ගොවීන්ට වුවද සුදුසු වේ. මෙම බලවේග ගොයම් පැළ සිටුවන යන්ත්‍රයේ ඊළඟ මාදිලිය වන පැදගෙන යන ආකාරයේ ගොයම් පැළ සිටුවන යන්ත්‍ර ද දැන් වෙළඳපොළේ දක්නට ලැබේ. එහි ක්ෂේත්‍ර ධාරිතාවය දිනකට අක්කර 4 - 5 පමණ වන අතර, ක්ෂේත්‍රයේ හැසිරවීම ඇදගෙන යන මාදිලියට වඩා පහසුය.

## වී වගාවේ යාන්ත්‍රිකව වල් මර්ධනය

### කෝණෝ වීඩරය



කෝණෝ වීඩරය

වී වගාවේදී පළමු මතුපිට පොහොර යෙදීමට පෙර වල් මර්ධනය විධිමත් පරිදි කළ යුතු වේ. මෙය වී වගාවේ අස්වැන්න කෙරෙහි බලපාන ප්‍රබල සාධකයකි. මෙහිදී වල් මර්ධනයත් සමඟ පස බුරුල්වීමද සිදුවේ. දිනකට අක්කර 3/4 ක පමණ එක් ශ්‍රමිකයෙකුට ඉතා සාර්ථකව වල් මර්ධනය සිදුකළ හැකිය. ගොයම් පේළි අතර අඟල් 8 ක පරතරයක් ඇති විට මෙය භාවිතා කළ හැකිය.

### කෝණෝ වීඩරය භාවිතා කිරීමෙන් ඇතිවන වාසි

- වීඩරය ගොයම් පේළි අතරින් ගමන් කිරීමේදී කිරිමුල් කැඩී නව මුල් ඇති වන නිසා ගොයම හොඳින් පඳුරු දමන අතර අස්වනු නෙළන කාලයේදී ඇද වැටීම අඩුවේ.
- දෙපස පේළි 2 ට මඩ එකතු වන විශේෂිත කෝණිත හැඩය, සාරවත් පඳුරක් නිර්මාණයට හේතු වේ.
- හොඳින් හිරුඑළිය ලැබීමත් පොහොර සඳහා තරඟකාරීත්වයක් නොපවතින නිසාත් වගාව සරුවී අස්වැන්න වැඩිවේ.
- වල් නාශක ඉසීමට අවශ්‍ය නොවන නිසා වියදම අවම වීමත් පරිසර හානිය අඩු වීමත් රසායනික ද්‍රව්‍ය සඳහා විදේශ රටවලට ඇදී යන මුදල් ඉතිරිවීමත් විශේෂ වාසියකි.

මෙම යන්ත්‍රය වර්ථමානයේ රු. 4,500.00 ක පමණ මුදලකට ලබාගත හැකිය.

### බලවේග වල් මර්ධකය



බලවේග වල් මර්ධකය

දැනට වල් මර්ධනය සඳහා භාවිතා කරන කෝණෝ වීඩරය මඟින් දිනකට වල් මර්ධනය කළ හැකි ප්‍රමාණය අක්කර 3/4 ක් පමණ වන බැවින්, ඊට වඩා වැඩි වපසරියක වල් මර්ධනය සිදු කිරීම සඳහා මෙම බලවේග වල් මර්ධකය නිපදවා ඇත. සැහැල්ලු කුඩා ධාරිතාවයක් සහිත එංජිමක් ආධාරයෙන් නිපදවා ඇති මෙම නව උපකරණය පේලියට බීජ වැපිරීම හෝ පැළ සිටුවීම සිදු කළ ක්ෂේත්‍ර වල වල් මර්ධනය සඳහා භාවිතා කළ හැකි අතර දිනකට එක් පුද්ගලයකුට අක්කර 2 පමණ ප්‍රමාණයක් වල් මර්ධනය සිදු කළ හැක. ක්ෂේත්‍රයේ භාවිතා කිරීමට පහසු වන පරිදි සැහැල්ලු ආකාරයෙන් නිර්මාණය කර තිබේ.

මේ හා සමාන යන්ත්‍ර ශ්‍රී ලංකාවට ආනයනය කරන අතර, මූලික තාක්ෂණික පිරිවිතරයන් බොහෝ දුරට සමාන වේ. යන්ත්‍රයේ බර, ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රබලව බලපාන අතර, කිලෝ ග්‍රෑම් 16 - 18 බරැති යන්ත්‍ර ක්ෂේත්‍රයේ හැසිරවීමට පහසු වේ.

## අස්වනු නෙලීම

### ගොයම් කැපීමේ යන්ත්‍රය




ගොයම් කැපීමේ යන්ත්‍රය

ගොයම් පැසුණු පසු නිසි වෙලාවට කපා ගැනීමටත්, කම්කරු හිඟයට සුදුසු පිළියමක් ලෙසත්, දැනට භාවිතයේ පවතින රෝද දෙකේ ට්‍රැක්ටරයට සවිකළ හැකි ගොයම් කැපීමේ උපාංගයක් ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් ගොවි ජනතාව වෙත හඳුන්වා දී ඇත.

මෙම යන්ත්‍රයෙන් දිනකට අක්කර 04 ක පමණ ගොයම් කපාගත හැකි අතර අස්වනු හානිය 1%ටත් වඩා අඩුය. සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර භාවිතා කිරීමට අපහසු ක්ෂේත්‍රවල භාවිතයට මෙම යන්ත්‍රය වඩා යෝග්‍ය වේ.

## කොළ මැඩීමේ යන්ත්‍රය

### අධිධාරිතා කොළ මැඩීමේ යන්ත්‍රය



අධි ධාරිතා කොළ මැඩීමේ යන්ත්‍රය

රෝද දෙකේ ට්‍රැක්ටරය මඟින් ක්‍රියාකරවිය හැකි මෙම යන්ත්‍රයෙන් සිදුවන අස්වනු හානිය හා පරිසර හානිය අවම වේ. අක්කරයක කොළ මැඩීමට පැය 1 1/2 ක පමණ කාලයක් ගතවේ. අස්වනු මැඩීමට අමතරව මනා පිරිසිදු වීමක් ද සිදු වන බැවින් අපද්‍රව්‍ය රහිත අස්වැන්නක් ලෙස ගබඩා කරගත හැකිය.

## බිත්තර වී පිරිසිදු කිරීම

### බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය



බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය

සාම්ප්‍රදායික තත්ත්වයෙන් ලබා ගන්නා වී, බිත්තර වී වශයෙන් සකස් කිරීම සඳහා වී පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් හඳුන්වාදී ඇත. මෙම යන්ත්‍රය මඟින් වල් ඇට, බොල් සහ වෙනත් සියලුම අපද්‍රව්‍ය ඉවත් කර උසස් තත්ත්වයේ බිත්තර වී, පැයකට කිලෝග්‍රෑම් 150 - 200 ත් අතර ප්‍රමාණයක් සකසා ගත හැක. ගෘහස්ථ භාවිතයට ගැලපෙන පරිදි නිර්මාණය කර තිබෙන අතර යන්ත්‍රයේ සල්ලඩ දැල් සීරු මාරු කිරීම මඟින් සම්බා සහ නාඩු යන බීජ දෙවර්ගයම සඳහා භාවිතා කළ හැකිය.

ඉහත යන්ත්‍රයේ නිෂ්පාදන ක්‍රමවේදයන් වැඩි දියුණු කර දිගු කාලයක් භාවිතා කළ හැකි පරිදි නව බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් මේ වන විට නිර්මාණය කර තිබෙන අතර ධාරිතාවය ඉහත යන්ත්‍රයේ පරිදිම වේ. මෙම නව යන්ත්‍රය ශක්තිමත් සැකිල්ලකින් යුක්ත වන බැවින් පෙර යන්ත්‍රයට වඩා දිගු කාලයක් අලුත්වැඩියාවකින් තොරව භාවිතා කළ හැකිය. මෙම යන්ත්‍රය රු. 180,000.00 ක පමණ මිලකට මිලදී ගත හැකිය.



නව බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය

## අධි ධාරිතා බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය



අධි ධාරිතා බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය

දැනට භාවිතා කරන බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය මධ්‍යම හා මහා පරිමාණ ගොවීන් හට ප්‍රමාණවත් නොවන බැවින්, පැයකට කිලෝ ග්‍රෑම් 400 ක් පමණ පිරිසිදු කිරීමට හැකි වන පරිදි මෙය නිර්මාණය කර තිබේ.

එමෙන්ම වඩා ශක්තිමත් සැකිල්ලකින් හා පිරිසිදු කිරීමේ සල්ලඩ දැල් වල සිරවන වී, ස්වයංක්‍රීයව ඉවත් වන ක්‍රමවේදයක් ඇතුළත් වන පරිදි නිර්මාණය කර තිබෙන බැවින් ඉහළ කාර්යක්ෂමතාවයක් ලඟා කර ගත හැක. මධ්‍ය පරිමාණ ගොවීන් හට ගැලපෙන ලෙස නිර්මාණය කළ ද ගෘහස්ථව භාවිතා කළ හැකි පරිදි එකලා මෝටරයක් මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. පෙර සඳහන් කළ බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍ර මෙන්ම සම්බා හා නාඩු යන දෙවර්ගයේම වී වර්ග පිරිසිදු කිරීම සඳහා භාවිතා කළ හැකිය.

## අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල යාන්ත්‍රීකරණය

බඩඉරිගු උඳු, මුං, සෝයා, කව්පි වැනි අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවේදී ද ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන ශ්‍රම ඌනතාවයට පිළියමක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් යාන්ත්‍රීකරණය සඳහා නව උපකරණ හඳුන්වාදී ඇත.

මෙසේ හඳුන්වා දී ඇති යන්ත්‍ර අතර බිම් සැකසීමට අදාල උපකරණ වලට අමතරව, විශාල වශයෙන් මිනිස් ශ්‍රමය අවශ්‍ය වන බීජ වැපිරීම, වල් මර්ධනය, ඇලි වැටි දැමීම සහ බීජ වෙන් කිරීම ආදී කාර්යයන් සඳහා ද නව යන්ත්‍ර ඇත.

## බිම් සැකසීමේ උපකරණ



රෝද දෙකේ ට්‍රැක්ටරයට සවි කළ කොකු නඟුල

මූලික බිම් සැකසීම සඳහා අශ්වබල 12 රෝද දෙකේ ට්‍රැක්ටරයට සවිකළ හැකි කොකු තුනකින් යුත් කොකු නඟුලක් හඳුන්වා දී ඇත. මෙමඟින් වඩා හොඳ බිම් පෙරලීමක් සිදුකළ හැක. ද්විතීයික බිම් සැකසීම රෝද දෙකේ ට්‍රැක්ටරයේ රොටරිය මඟින් සිදුකෙරේ.

## බීජ වැපිරීමේ උපකරණ

බීජ සිටුවීම සඳහා බීජ වප්කර ආකාර කිහිපයකින් හඳුන්වාදී ඇත. මෙම බීජ වප්කර බඩඉරිඟු මෙන්ම අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවන් වන මුං, උඳු, සෝයා, කව්පි ආදී බීජ පේළියට සිටුවීමට භාවිතා කළ හැකිය. මෙම යන්ත්‍ර සීරු මාරු කිරීම මඟින් අදාළ බෝගය සඳහා පේළි සහ පැළ අතර පරතරය වෙනස් කරගත හැකිය.

උදාහරණ :
මෙම බීජ වප්කර මඟින් බඩඉරිඟු බීජ වැපිරීමේදී පේළි අතර පරතරය සෙන්ටිමීටර් 80 ක් සහ පැළ අතර පරතරය සෙන්ටිමීටර් 23 ක් ලෙස පවත්වා ගනී.

මේ ආකාරයට පේළි සහ පැළ අතර පරතරය වෙනස් කිරීම තුලින් බලාපොරොත්තු වන ප්‍රධාන කාර්යය වන්නේ බීජ දැමීමෙන් පසු සිදුකරනු ලබන අනෙකුත් ක්ෂේත්‍ර කාර්යයන් යාන්ත්‍රිකව සිදුකිරීමට පහසුකර ගැනීමයි.

### 01. ගොඩ බෝග බීජ වප්කරය
(අතින් ක්‍රියාකරන)



ගොඩ බෝග බීජ වප්කරය
(අතින් ක්‍රියා කරන)

මෙම යන්ත්‍රය ඉතා සැහැල්ලු තනි පුද්ගලයෙකුට ඇදගෙන යා හැකි පරිදි සකසා ඇත. ප්‍රාථමික හා ද්විතීයික බිම් සැකසීම කළ භූමියේ මෙම යන්ත්‍රය ක්‍රියා කරවීමෙන් කාණුවක් සෑදී බීජ ඒ තුළට වැටීම සහ වැසී යාම සිදුවේ. එමඟින් එකවර පේළි දෙකක බීජ දැමීම සිදුවන අතර දිනකදී අක්කර දෙකක පමණ ප්‍රමාණයක බීජ දැමීම සිදුකළ හැකිය. පේළි අතර පරතරය අවශ්‍ය පරිදි වෙනස් කරගත හැකිය.

මෙම බීජ වප්කරය බඩඉරිඟු පමණක් නොව උඳු, මුං හා සෝයා වැනි අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවන්හිදී බීජ පේළියට වැපිරීම සඳහා භාවිතා කළ හැකිය. ඉතා හොඳින් කැට පොඩි වන සේ සකස් කළ භූමියක දී යන්ත්‍රය නිවැරදිව ක්‍රියාකරයි. සලකුණු කිරීමේ ඊතලය මඟින් පේළි 02 ක් අතර පරතරය පවත්වා ගනී. වර්තමානයේ රු. 18,000.00 ක් වැනි මිලකට මෙම යන්ත්‍රය මිලදී ගත හැකිය.

## 02. ගොඩ බෝග බීජ වප්කරය

(රෝද 2 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන)



ගොඩ බෝග බීජ වප්කරය
(රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධ කරන)

දෙරෝද ට්‍රැක්ටරයට සම්බන්ධ කළ හැකි පරිදි සකසා ඇත. බිම් සකසන ලද භූමියේ එකවර පේළි දෙකක බීජ දැමීම සිදුකළ හැක. යන්ත්‍රය ක්‍රියාකිරීමේදී කාණුවක් සැකසීමත්, බීජ වැටීමත්, එම බීජ පසෙන් වැසී යාමත්, යාන්ත්‍රිකව සිදුවන පරිදි මෙම බීජ වප්කරය සකසා ඇත. එක් දිනකදී අක්කර 3 ක පමණ භූමියක බීජ දැමීමට යන්ත්‍රයට හැකියාව ඇත. මෙම යන්ත්‍රය බඩඉරිඟු වලට අමතරව උඳු, මුං හා සෝයා වැනි වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ වැපිරීම සඳහා ද යොදාගත හැක. මේ සඳහා ද හොඳින් කැට පොඩි වන සේ සකස් කළ භූමියක් අත්‍යවශ්‍ය වේ. වර්තමාන මිල රු. 45,000.00 ක් පමණ වේ.

## 03. රෝද 2 ට්‍රැක්ටරයේ රොටරියට සම්බන්ධ කරන සීඩරය



රෝද 2 ට්‍රැක්ටරයේ රොටරියට
සම්බන්ධ කරන සීඩරය

ගොඩ බෝග වගා ක්ෂේත්‍රයන් වල ද්විතියික බිම් සැකසීම සිදුකරන අතරතුර බීජ වැපිරීම සිදු කිරීමට හැකිවන පරිදි මෙය නිර්මාණය කර තිබේ. මෙම යන්ත්‍රයෙන් කාර්යයන් දෙකක් එකවර සිදුකරන බැවින්, ඉන්ධන හා මිනිස් ශ්‍රමය සඳහා වැයවන වියදම අඩකින් පමණ අඩුවන අතර, නිසි කාලයට වගාව ස්ථාපිත කිරීම සිදුකරගත හැකිය.

වරකට පේළි දෙකක බීජ වැපිරීම සිදු කරන අතර වප්කරය රෝද දෙකේ ට්‍රැක්ටරයේ රොටරියට සම්බන්ධ කරනු ලැබේ. මුං, උඳු, කව්පි වැනි ගොඩ බෝග

සඳහා භාවිතා කරීමට යෝග්‍ය වේ. මෙහිදී එක් එක් බෝගයට නිර්දේශිත ලෙස පේළි අතර හා පැළ අතර පරතරය පවත්වා ගත හැකිය. පේළි අතර සෙන්ටිමීටර් 60 ක පරතරයට බීජ වැපිරීම සිදුකළ හැකි බැවින්, බඩඉරිඟු වගාව සඳහා ද භාවිතා කළ හැකිය. වර්තමානයේ මෙම යන්ත්‍රය රු. 45,000.00 ක පමණ මිලකට ලබාගත හැකිය.

## 04. රෝද 02 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ඉන්ජෙක්ටර් ප්ලාන්ටරය



රෝද 2 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ඉන්ජෙක්ටර් ප්ලාන්ටරය

මෙය රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධ කළ හැකි පරිදි සකසා ඇති අතර, විශේෂයෙන් බිම් සැකසීමකින් තොරව බඩඉරිඟු බීජ දැමීම සඳහා යොදා ගත හැක. පොළොවේ ප්‍රශස්ථ තෙතමන තත්ත්ව යටතේ මෙම යන්ත්‍ර ක්‍රියාකිරීමෙන් බීජ පොළව තුළට ඇතුල්වීම සහ වැසී යාම සිදුවේ. ඉන්ජෙක්ටර් ප්ලාන්ටරය ක්‍රියාකිරීමේදී එකවර පේළි දෙකක බීජ දැමීම හා වැසීම සිදුවේ. දිනකදී බිම් සකස් නොකළ භූමියක අක්කර 3 ක පමණ බීජ වැපිරීම සිදුකල හැකිය. පේළි අතර සෙන්ටිමීටර් 80 ක් හා පැළ අතර සෙන්ටිමීටර් 23 ක පරතරයක් පවත්වාගත හැකිය. මෙම යන්ත්‍රයේ වර්තමාන මිල රු. 45,000.00 ක් පමණ වේ.

## 05. රෝද 04 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ඉන්ජෙක්ටර ප්ලාන්ටරය



රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ඉන්ජෙක්ටර් ප්ලාන්ටරය

විශාල වගා ක්ෂේත්‍රයන් වලට ගැලපෙන ආකාරයට එක් වරකට බීජ පේළි 4 ක් පමණ බීජ වැපිරීම සිදු කළ හැකි වන පරිදි නිර්මාණය කර තිබේ. බිම් සැකසීමකින් තොරව වුවද ප්‍රශස්ථ තෙතමනය සහිත ක්ෂේත්‍රයක බීජ වැපිරීම සිදුකළ හැකිය. බඩඉරිඟු වගාව සඳහාම පමණක් භාවිතා කළ හැකි අතර, වගාවේ ඉදිරි අවධීන් යාන්ත්‍රිකරණය කිරීමේ පහසුව සකසා දෙමින් බීජ වැපිරීම කරයි. රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධ කරන

උපකරණ මෙන් නොව මෙය පදවාගෙන යා හැකි ආකාරයට නිර්මාණය කර තිබෙන බැවින් දිනකට අක්කර 8 ක පමණ භූමියක බීජ වැපිරීම සිදු කළ හැකිය. ප්‍රමාණයෙන් විශාල ක්ෂේත්‍ර වල භාවිතා කිරීමේදී වැඩි කාර්යක්ෂමතාවක් ලබාගත හැකිය.

## 06. රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ගොඩ බෝග බීජ වප්කරය



රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ගොඩ බෝග බීජ වප්කරය

විශාල වගා ක්ෂේත්‍රයන්ට ගැලපෙන පරිදි උඳු, මුං, සෝයා, කව්පි, බඩඉරිඟු ආදී අතිරේක ආහාර බෝග පේළියට වැපිරීම සඳහා රෝද 4 ට්‍රැක්ටරයේ කොකු නඟුල ආධාරයෙන් මෙය නිර්මාණය කර තිබේ. බෝගයට අනුව පේළි අතර පරතරය හා පැළ අතර පරතරය පවත්වාගත හැකි අතර, ඒ අනුව පේළි 3, 4, 5 ලෙස වරකට දමන පේළි ගණන ද වෙනස් කරගත හැකිය. දිනකට අක්කර 6 - 8 පමණ බීජ වැපිරීම සිදුකළ හැකිය. කොකු නඟුල් තල ආධාරයෙන් නිර්මාණය කර තිබෙන නිසා ක්ෂේත්‍රයේ ඇති මුල්, ගල් වැනි බාධකයක වප්කරයේ නඟුල් තල ගැටුණු ද බාධාවකින් තොරව බීජ වැපිරීම සිදු කළ හැකිය. එක් එක් බෝගය සඳහා වන බීජ තෝරන තැටි ඉතා පහසුවෙන් වෙනස් කළ හැකි බැවින් බෝගයෙන් බෝගයට යන්ත්‍රය සීරුමාරු කිරීම කෙටි කාලයකින් සිදු කළ හැකිය.

මෙම සෑම බීජ වප්කරයකින්ම අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවන්හි නිර්දේශිත පරතරවලට අනුව බීජ වැපිරීම සිදුකළ හැකිය. මේ මගින් ඉදිරි ක්ෂේත්‍ර කටයුතු යන්ත්‍ර මගින් ඉටුකරගැනීමට පහසුවේ.

## බඩඉරිඟු වගාවේ වල් මර්ධනය හා වැටි දැමීමේ උපකරණය



ඇලි වැටි දැමීමේ උපකරණය

බෝගය සිටුවා දින 14 න් සහ දින 28 න් දෙරෝද ට්‍රැක්ටරයේ රොටවේටරයට අමුණා පේළි අතර ගමන් කිරීම මගින් පහසුවෙන් වල් මර්ධනය සිදුකළ හැක. වල් මර්ධනයට අමතරව පස බුරුල්වීමක් සිදුවන නිසා බෝගය හොඳින් වැඩීම සිදුවේ. බීජ

වැපිරීමේදී පේළි අතර සෙන්ටිමීටර් 80 ක් පරතරයක් පවත්වා ගත් බැවින්, ඉතා පහසුවෙන් පේළි 2 ක් අතරින් රෝද දෙකේ ට්‍රැක්ටරය ගමන් කරවිය හැක. සාම්ප්‍රදායික ලෙස උදලු ගෑම මගින් සිදුකරන වල් මර්ධනයට වඩා ලාභදායී මෙන්ම පහසු වේ.

## පොහොර යෙදීම හා වැටි දැමීම

දෙවන වර වල් මර්ධනයට පෙර එනම් දින 28 දී පේළි ආසන්නයේ අතින් පොහොර යොදා රෝද දෙකේ ට්‍රැක්ටරයට රොටවේටරය හා වැටි දමනය (රිජරය) සවිකොට පේළි අතර ක්‍රියාකරවීමෙන් වල් මර්ධනයත්, ගස් මුල පස් වැටියක් ඇතිවීමෙන් පොහොර එයට යටවීම සිදුවේ. වැටි අතරින් සුදුසු පරිදි ජල සම්පාදනය සිදුකළ හැකිය. දෙවනවර වල් මර්ධනයෙන් පසුව වගාව වල් පැළෑටි අභිබවා වැඩෙන බැවින් නැවත වල් මර්ධනයක් අවශ්‍ය නොවේ. උදලු මගින් පස් වැටි දැමීමට වඩා කාර්යක්ෂමතාවය වැඩි අතර, ලාභදායී වේ. නිෂ්පාදන වියදම ද අඩු වේ. වත්මන් මිල රු. 5,000.00 ක් පමණ වේ.

## බඩ ඉරිඟු අස්වනු මඩින යන්ත්‍රය




රෝද 2 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන බඩඉරිඟු අස්වනු මඩිනය

බඩඉරිඟු කරලෙන් බීජ වෙන් කිරීම සඳහා විශේෂයෙන්ම සැකසූ මෙම යන්ත්‍රය රෝද දෙකේ ට්‍රැක්ටරය හා සම්බන්ධ කර ක්‍රියාකිරීමේ හැකියාව ඇත. බඩඉරිඟු කරල් අස්වනු මඩින යන්ත්‍රයට දැමීමට පෙර හිරුඑළියේ හොඳින් වියලාගත යුතුය. කොළපු ගැලවූ මෙන්ම කොළපු නොගැලවූ කරල්වලද බීජ වෙන් කිරීමේ හැකියාව මෙම යන්ත්‍රය සතුය. මෙමගින් බීජ වෙන්වීම, පිරිසිදු වීම යන කාර්යයන් දෙකම සිදුවන නිසා පිරිසිදු බීජ අස්වැන්නක් ලබා ගත හැකිය. මෙම යන්ත්‍රයෙන් බඩඉරිඟු බීජ වලට සිදුවන හානිය අවම වන බැවින් වෙළඳපොළෙහි වැඩි වටිනාකමක් ලබා ගැනීමටද හැකියාව ඇත. අස්වනු මැඩීමේ කාර්යක්ෂමතාවය 98% ක් පමණ ඉහළ අගයක් ගනී. තවද ලඩ සමග බීජ ඉවත් වීම ඉතා අඩුවන බැවින් මෙම

අස්වනු හානිය 1% ක් පමණ අවම අගයක් වේ. මේ නිසා මැඩ ගත් අස්වැන්න මුලුමනින්ම පාහේ අළෙවි කිරීමේ හැකියාවක් ඇත. කොළපුව සහිතව අස්වනු මැඩීමේ දී පැයකට කිලෝග්‍රෑම් 1500 ක් පමණ ද කොළපුව රහිතව කිලෝග්‍රෑම් 2500 ක් පමණ ද අස්වනු මැඩීම සිදු කළ හැකිය. වර්තමාන මිල රු. 180,000 ක් පමණ වේ.

මෙම යන්ත්‍රයේ ධාරිතාවය මහා පරිමාණ ගොවීන් සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධකර ක්‍රියාකරවිය හැකි පරිදි පැයකට කිලෝ 5000 ක පමණ ධාරිතාවයෙන් යුත් අධිධාරිතා බඩඉරිගු අස්වනු මඩින යන්ත්‍රයක් හඳුන්වා දී තිබේ. මෙහි ගුණාත්මකභාවය පෙර යන්ත්‍රයේ පරිදිම වන අතර, භාවිතය ද බොහෝ පහසු වේ.



රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන බඩඉරිගු අස්වනු මඩිනය

## බහු බෝග අස්වනු මැඩීමේ යන්ත්‍රය



බහු බෝග අස්වනු මඩිනය

බහුබෝග අස්වනු මඩිනය මඟින් අතිරේක ආහාර බෝග වල බීජ වෙන්කර ගැනීමේ හැකියාව ඇත. මෙම අස්වනු මඩිනය බලගැන්වනුයේද රෝද දෙකේ ට්‍රැක්ටරය මඟිනි. මෙහි අධාරිතාවය පැයකට කිලෝ ග්‍රෑම් 1000 කි. මෙම යන්ත්‍රය උඳු, මුං, කව්පි වැනි බෝග සඳහා යොදාගත හැකිය. බීජ වලට සිදුවන හානිය අවම වේ. අස්වනු මැඩීමෙන් පසු පිරිසිදු කිරීම සඳහා සුළං කිරීම අත්‍යාවශ්‍ය වේ.

## මාෂ බෝග පියලි කිරීමේ යන්ත්‍රය



මාෂ බෝග පියලි කිරීමේ යන්ත්‍රය

මුං, උඳු, සෝයා, තෝර පරිප්පු, වැනි මාෂ බෝග වල පිටත පොත්ත ඉවත් කර පියලි කිරීම සඳහා ගැලපෙන ආකාරයට මෙය නිර්මාණය කර තිබේ.

ප්‍රථමයෙන්ම යන්ත්‍ර භාවිතා කර බීජ වල ප්‍රමාණය අනුව වර්ග කිරීම සිදු කරන අතර, ඉන්පසු යන්ත්‍ර තුලින් බීජ යවා පිටත පොත්ත සුළු වශයෙන් පලුදු කිරීම කරනු ලැබේ. ඉන් පසු පැය 3 ක් පමණ කාලයක් බීජ වතුරේ පොගවා මද පවනේ හොඳින් වියලා ගැනීම සිදුකරනු ලැබේ. ඉන් අනතුරුව දෙවන වරට යන්ත්‍රය තුළින් බීජ යැවීමේදී පලුදු වූ පිට පොත්ත ඉවත් වී පියලි වීම සිදුවේ. මෙහිදී පොත්ත ඇතුළු අපද්‍රව්‍ය වෙන වෙනම ඉවත් වන බැවින් පිරිසිදු පියලි ලබා ගත හැකිය. පැයකට කිලෝග්‍රෑම් 30 පමණ පියලි කිරීම සිදු කරන අතර, එකලා විදුලි මෝටරයක් මගින් ක්‍රියාත්මක කරනු ලබයි. වර්තමාන මිල රු. 180,000.00 ක් පමණ වේ.

## අනෙකුත් වගාවන් සඳහා භාවිතා වන යන්ත්‍ර

ඉහත සඳහන් ක්ෂේත්‍ර බෝග වලට අමතරව කුරක්කන්, රටකජු වැනි වගාවන් සඳහා ද භාවිතා කිරීමට සුදුසු යන්ත්‍ර ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මගින් හඳුන්වාදී ඇත.

### 01. රටකජු පොතු ගලවන යන්ත්‍රය (අතින් ක්‍රියා කරන)



අතින් ක්‍රියා කරන (රටකජු පොතු ගලවන යන්ත්‍රය)

ගෘහස්ථ භාවිතයට සුදුසු වන පරිදි රටකජු කරල් වලින් පොතු ගලවා ඉවත් කිරීමට මෙම යන්ත්‍රය නිර්මාණය කර තිබේ.

පැයකට කිලෝග්‍රෑම් 25 - 30 ක පමණ පොතු ගැලවීමට හැකි අතර ඉවත් වන පොතු හා රටකජු ඇට මිශ්‍රව පවතින බැවින් කුල්ලකින් පොලා ඇට වෙන් කර ගැනීමට සිදු වේ. රටකජු කරල් වල

ප්‍රමාණය අනුව යන්ත්‍රයේ භාවිතා කරන දැල වෙනස් කළ යුතුය. මෙම උපකරණය රු. 15,000.00 ක පමණ මිලකට මිලදී ගත හැකිය.

## 02. රටකජු පොතු ගලවන යන්ත්‍රය (මෝටරය සහිත)



රටකජු පොතු ගලවන යන්ත්‍රය (මෝටරය සහිත)

අතින් ක්‍රියාත්මක කරන යන්ත්‍රයේ ධාරිතාවය වාණිජ වශයෙන් රටකජු පොතු ගැලවීම සිදු කරන සමාගම් වලට ප්‍රමාණවත් නොවන බැවින්, එම අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට මෙම යන්ත්‍රය නිර්මාණය කර තිබේ. පැයකට කිලෝග්‍රෑම් 100, 200 හා 400 වශයෙන් පරිමාණ 3 ක් යටතේ යන්ත්‍ර නිර්මාණය කර තිබේ.

රටකජු පොතු, යන්ත්‍රය මගින්ම ඉවත් කරන බැවින් අමතර පිරිසිදු කිරීමකින් තොරව රටකජු බීජ ලබා ගැනීමේ හැකියාව පවතී. පොතු ඉවත් වී එන රටකජු වලින් කුඩා ප්‍රමාණයේ රටකජු වෙනම ඉවත් වී පැමිණෙන බැවින් විකිණීම සඳහා නැවත ප්‍රමාණය අනුව වර්ග කිරීම අවශ්‍ය නොවේ. මෙම යන්ත්‍රයේ වර්තමාන මිල රු. 200,000.00 ත් රු. 300,000.00 අතර වේ.

## 03. කුරක්කන් අස්වනු මඩිනය



කුරක්කන් අස්වනු මඩිනය

කුරක්කන් වගාවේ දී ඉතා අසීරු කටයුත්තක් වන අස්වනු මැඩීම සඳහා ගැලපෙන අයුරින් මෙය නිර්මාණය කර තිබේ.

පැයකට කිලෝග්‍රෑම් 50 - 60 ත් අතර ප්‍රමාණයෙන් අස්වනු මැඩීමේ හැකියාව තිබෙන අතර එකලා විදුලි

මෝටරයක් මඟින් ක්‍රියා කරවන බැවින් ගෘහස්ථව පවා භාවිතයට ගත හැකිය. වැලි, දූවිලි වැනි අපද්‍රව්‍ය ඉවත් වූ ඉහළ ගුණාත්මයෙන් යුත් බීජ වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. මෙම යන්ත්‍රය රු. 150,000.00 පමණ මිලකට මිලදී ගත හැකිය.

මෙම යන්ත්‍රය වැඩි දියුණු කිරීම මඟින් ලොකු ලූනු වලින් බීජ වෙන් කිරීම සඳහා ද ගැලපෙන පරිදි නිර්මාණය කර තිබෙන අතර, අවශ්‍ය සීරු මාරු කිරීම් සරලව සිදු කළ හැකිය.

එමෙන්ම මෙහි ධාරිතාවය පැයට කිලෝග්‍රෑම් 300 දක්වා වැඩි කර රෝද 2 ට්‍රැක්ටරය මඟින් ක්‍රියාකරවිය හැකි ආකාරයට අධිධාරිතා කුරක්කන් අස්වනු මඩිනයක් ද මේ වන විට හඳුන්වා දී තිබේ.



අධිධාරිතා කුරක්කන් අස්වනු මඩිනය

## 04. ලොකු ලූනු මල් වලින් බීජ වෙන් කිරීමේ යන්ත්‍රය



ලොකු ලූනු මල් වලින් බීජ වෙන් කිරීමේ යන්ත්‍රය

ලොකු ලූනු සත්‍ය බීජ නිෂ්පාදන ක්‍රියාවලියේදී ඉතාමත් අපහසු කාර්යයක් වන මල් වලින් බීජ වෙන් කර ගැනීම සඳහා මෙම යන්ත්‍රය නිර්මාණය කර ඇත. මෙය එකලා විදුලිබලයෙන් ක්‍රියාත්මක වන අතර පැයකට බීජ කිලෝග්‍රෑම් 50 ක් පමණ නිෂ්පාදනය කර ගත හැක. බීජ වලට කිසිදු හානියක් නොවන ආකාරයට මෙය නිර්මාණය කර ඇත.

ඉහත උපකරණ නිසි පරිදි නිසි කලට භාවිතා කිරීමෙන්, විශාල ශ්‍රම ඉතිරියක් මෙන්ම වියදම අවම කර ගැනීමටද, කාලය ඉතිරි කර ගැනීමටද හැකියාවක් ඇත. විශේෂයෙන්ම මෙම

යන්ත්‍ර භාවිතයෙන් වැඩි ගුණාත්මයෙන් යුතු අස්වැන්නක්ද ලබා ගත හැකි අතර, එමගින් ගොවි මහතුන්ට ඉහළ ආදායමක් ලබා ගත හැකිය.

## 05. මඤ්ඤොක්කා පෙති කපන යන්ත්‍රය




මඤ්ඤොක්කා පෙති කපන යන්ත්‍රය

මඤ්ඤොක්කා සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මෙම යන්ත්‍රයට දමා යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමෙන් පැයකට කිලෝග්‍රෑම් 50 - 60 ක පෙති කපාගත හැකිය.

## 06. ගොඩ බෝග වගාව සඳහා වල් මර්ධන උපකරණ

ගොඩ බෝග වගාවේ වල් මර්ධනය සඳහා දැනට බහුලව භාවිතා කරනු ලබන්නේ උදැල්ලයි. නමුත් වඩාත් කාර්යක්ෂම ලෙස වල් මර්ධනය කිරීමට හැකි වන පරිදි අත් උපකරණ වර්ග කීපයක් හඳුන්වා දී ඇත.

### 6.1 ස්විස් හෝ



ස්විස් හෝ

ගොඩ බෝග වගාවන්හි පේළි අතර ඇති වල් පැළ මෙම උපකරණය ඉදිරියට තල්ලු කිරීම හා පසුපසට ඇදීම තුළින් වල් මර්ධනය සිදුකළ හැකිය. ධාරතාවය දිනකට අක්කර 01 ක් පමණ වේ.

### 6.2 කොකු තුනේ වල් මර්ධන උපකරණය



කොකු තුනේ වල් මර්ධන උපකරණය

ගොඩ බෝග වගාවන්හි පේළි/ පැළ අතර මෙය ක්‍රියාකරවීමෙන් වල් මර්ධනය මෙන්ම පස බුරුල් කිරීමද, පොහොර පසට මිශ්‍ර කිරීම එකවරම සිදුකළ හැකිය. ධාරිතාවය දිනකට අක්කර 1/4 පමණ වේ.

## 07. පළතුරු සහ වෙනත් බෝග සඳහා සරල උපකරණ

### 7.1 පළතුරු අස්වනු නෙලනයන්



පළතුරු අස්වනු නෙලනයන්

අඹ, පැපොල්, අලිගැටපේර වැනි පහසුවෙන් තැලීම් වලට ලක්වන පළතුරු නෙලාගැනීමේදී සිදුවන හානි අවම වන පරිදිත් උස ගස් වල ඇති පළතුරු නෙලා ගැනීම සඳහාත් නිපදවා ඇති සරල අතින් ක්‍රියා කළ හැකි පළතුරු අස්වනු නෙලන කිහිපයක් හඳුන්වාදී ඇත.

### 7.2 දෙහි දොඩම් අතු කප්පාදු කිරීමේ උපකරණය



දෙහි දොඩම් අතු කප්පාදු කිරීමේ උපකරණය

පැගිරි කුලයට අයත් ගස් කප්පාදුව හා හැඩ ගැන්වීම පිණිස යොදාගැනීමට සුදුසු උපකරණයකි. මෙහි ඇති වෙනත් ප්‍රයෝජන නම් රඹුටන්, දෙළුම් වැනි ශාක වල අතු කැපීම, බද්ධ අංකුර පහසුවෙන් කප්පාදු කර ගැනීම සිදුකරගත හැකි අතර දිනකට ශාක 50 - 75 දක්වා ප්‍රමාණයක අතු කප්පාදු කිරීමට හැකිය.

### 7.3 ශාක බද්ධ අනුජ නෙලාගැනීමේ උපකරණය



ශාක බද්ධ අනුජ නෙලාගැනීමේ උපකරණය

ශාක බද්ධ කිරීම සඳහා සුදුසු අනුජ කප්පාදු කරගැනීම සහ කටු සහිත ගස්වල ඉහළ කඩා අතු කැපීම, උද්‍යාන ශාක හැඩ ගැන්වීම, තේක්ක ගස් වල මාංශල අතු කැපීම සඳහා සුදුසු උපකරණයකි. මෙමගින් පැයකට අනුජ 75 - 150 දක්වා ප්‍රමාණයක් කප්පාදු කර කපාගත හැකිය. උස අඩි 13 සිට අඩි 18 දක්වා සීරු මාරු කර ක්‍රියාකරවිය හැකිය.

7.4 තිබ්බටු ගස් වල අස්වනු නෙලීමේ උපකරණය



තිබ්බටු ගස් වල අස්වනු නෙලීමේ උපකරණය

තිබ්බටු ගස් වල අස්වනු නෙලීම, අතු කප්පාදු කිරීම සහ කටු සහිත ගස්වල ඵල නෙලීමට සුදුසු උපකරණයකි. පැයකට කිලෝග්‍රෑම් 20 - 30 දක්වා අස්වනු නෙලීමට හැකිය. මෙම උපකරණයේ ඇති දැල් සහිත කූඩය අවශ්‍ය අවස්ථා වල ගලවා වෙන් කර භාවිතා කිරීමට ද හැකියාවක් ඇත.

## ජල සම්පාදනය

වී වගාවේදී මෙන්ම අනිකුත් වගාවන් වලට ද ජල සම්පාදනය අත්‍යාවශ්‍ය කටයුත්තකි. වර්ෂා පෝෂිත වගා ප්‍රදේශ වලට මෙන්ම වාරි මාර්ග ක්‍රම යටතේ වගා කරන ප්‍රදේශ වලටද නිසි වේලාවට ජලය සම්පාදනය කිරීමට නොහැකි වීම වගා විනාශයට බලපාන ප්‍රධානතම කරුණක් වී තිබේ. මෙහිදී බොහෝ ගොවි මහතුන් අඟල් 2, 3, 4 ප්‍රමාණ වල වතුර පොම්ප ඩීසල් හෝ භූමිතෙල් එංජිමක් ආධාරයෙන් ක්‍රියාත්මක කරන ලබන නමුත් මෙය ආර්ථික වශයෙන් ඵලදායී නොවේ. එයට පිලියමක් ලෙස අප ආයතනය රෝද දෙකේ අත්ට්‍රැක්ටරයකින් ක්‍රියාත්මක කරනු ලබන අඟල් 6 අක්ෂිය චලන ජල පොම්පය හා රෝද හතරේ ට්‍රැක්ටරයකින් ක්‍රියාත්මක කරනු ලබන අඟල් 12 අක්ෂීය චලන ජල පොම්පයක්ද හඳුන්වා තිබේ.

### 01. අඟල් 6 අක්ෂිය චලන ජල පොම්පය



අඟල් 6 අක්ෂිය චලන ජල පොම්පය

රෝද 2 ට්‍රැක්ටරයට සම්බන්ධ කර ක්‍රියාත්මක කරනු ලබන මෙම පොම්පය මඟින් අඟල් 6ක පමණ ජල ධාරාවක් ලබා දෙනු ලැබේ. විනාඩියට ලීටර් 5000 ක් පමණ අඩි 25 ක උසකට එසවිය හැකි අතර, ජලයේ ගිල්වා ක්‍රියාත්මක කරනු ලබන බැවින් ඇදගැනීමේ උසක් නොමැත.

පැයකට ඉන්ධන අවශ්‍යතාවය ලීටර් 1.2 ක පමණ වේ. ක්ෂේත්‍රයේ උස ස්ථානයකට ජලය සපයා ඉන් පසු ඇල

මාර්ග ඔස්සේ ජල සම්පාදනය කළ හැක. ඇළක්, ගඟක්, වැවක් වැනි ජල ප්‍රභව මඟින් ජලය ලබා ගැනීමට යොදා ගත හැක.

ඉහත පොම්පය තවදුරටත් වැඩි දියුණු කර අඟල් 12 ක ජල ධාරාවක් ලබා ගත හැකි පරිදි නවතම පොම්පයක් නිර්මාණය කර ඇත.

## 02. අඟල් 12 අක්ෂිය චලන පොම්පය



අඟල් 12 අක්ෂිය චලන පොම්පය

රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධ කර එහි බලය පිටතට ලබා ගන්නා භ්‍රමන දණ්ඩ (P.T.O.) මඟින් බලය යොදවන පරිදි නිර්මාණය කර තිබේ. අඩි 10 ක පමණ උසකට විනාඩියකට ජලය ලීටර් 20,000 ක් පමණ එසවිය හැකි අතර ජලාශයක්, වැවක්, ඇළක් වැනි ප්‍රභවයන්ගෙන් ජල සම්පාදනය සඳහා යෝග්‍ය වේ.

මෙම පොම්පයද ජලයේ ගිල්වන ආකාරයේ එකක් බැවින් ඇද ගැනීමේ උසක් නොමැත.

මෙම ප්‍රකාශනයෙහි සඳහන් යන්ත්‍ර වල
මිල ගණන් සහ අනෙකුත් සියලූම උපදෙස්
පහත සඳහන් දුරකථන අංක සහ ලිපිනයෙන් ලබාගත හැකිය.

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය,
මහඉලුප්පල්ලම.

දුරකථන අංක : 025 56 22 500
025 56 22 200

ෆැක්ස් : 025 222 4922
071 880 2929